රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**SLS 3202** - නූතන සිංහල ගද්‍ය සාහිත්‍යය

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

කාලය : පැය 03

---

## <u>'අ' කොටස</u>

01. නවකථාවක නිරූපිත චරිතවල ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමෙන් පුද්ගල අනුභූතීන් පුළුල්වන ආකාරය ඔබට අභිමත නවකථා දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. ආගම සහ මිනිසා අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය මුල්කාලීන ප්‍රබන්ධකථාකරුවන්ගේ අවධානයට ලක් වූ අයුරු සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

03. මුල්කාලීන සිංහල ප්‍රබන්ධකථාකරුවන් ස්වකීය ග්‍රන්ථ හැඳින්වීම සඳහා ස්ත්‍රී නාම යොදා ගැනීම පිළිබඳ ව සාකච්ඡාවක යෙදෙන්න.

04. ඩබ්.ඒ. සිල්වාගේ නවකථා ජනප්‍රිය වීමට බලපෑ හේතු විවරණය කරන්න.

05. "කෙටිකතාවකින් අපේක්ෂිත අර්ථය සහ රසය තීව්‍ර වන්නේ, ආඛ්‍යානයට සහ චරිතවලට ගැලපෙන බස්වහරක් භාවිත කිරීමෙනි." උක්ත ප්‍රකාශය ඔබට අභිමත කෙටිකතා දෙකක් ඇසුරෙන් විමසන්න.

2/1
20

## <u>'ආ' කොටස</u>

06. <u>යුගාන්තය</u> නවකථාවේ නිරූපිත කම්කරු අරගල පිළිබඳ ව ස්වාධීන සාකච්ඡාවක යෙදෙන්න.

07. 'දෙවොන්දරාසං' නම් වූ අතිශය සංවේදී මිනිසාගේ ජීවන අත්දැකීම් සම්බන්ධයෙන් ස්වාධීන විග්‍රහයක යෙදෙන්න.

08. "මානව සම්බන්ධතා විෂයෙහි දැකිය හැකි පුද්ගලානුබද්ධ චෛතසික චර්යා, කෙටිකතා මාධ්‍යයේ දී තීව්‍ර කර දක්වයි." නිර්දිෂ්ට කෙටිකතා දෙකක් ඇසුරෙන් පහදන්න.

09. කෙටිකතාකරුවන් සිය ජීවන අත්දැකීම්, නිර්මාණකරණය හා ගලපා ඇති ආකාරයෙහි අපූර්වත්වය නිර්දිෂ්ට කෙටිකතා ඇසුරෙන් විමසන්න.

(එක් පිළිතුරකට ලකුණු 16 බැගිනි.)

@@@@@@@@